
# වැඩ බැරි දූස ගැන කතා

10

නිකොලායි නොසව්



# අනතුර



සී/ස ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්.) සමාගම

# වැඩ බැරි දූස ගැන කතා

## නිකොලායි නෝසව්

10


# අනතුර

අනුවාදය - දැදිගම වී. රුද්රිගු

චිත්‍ර - බරීස් කලෞෂින්

නව පරිගණක සකැසුම - මාලක ලලනජීව

නව මුද්‍රණය 2018



**සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස**

91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08





සමහර ළමයින් සිතනවා ඉහළ යන තරමට රස්නය වැඩි වෙනවා කියලා. නමුත් එය ඇත්ත නොවේ. ඉහළ යන තරමට සීතල වැඩි යි. හේතුව කුමක් ද? හිරු එයාගේ රශ්මි ධාරාවලින් වාතය දුබල ලෙස රත් කරන නිසා. ඒ වගේ ම වාතය බොහෝ විනිවිද යන සුළු නිසා. හිරුගේ රශ්මි ධාරාවලින් මහ පොළොව රත් කරනවා. එවිට පොළොවේ රස්නය නිසා වාතය රත් වෙන්නේ, රස්නය ඇති ළිපකින් රත් වෙනවා වගේ ය. රත් වූ වාතය හීතල වාතයට වඩා සැහැල්ලු නිසා එය ඉහළ නගිනවා. මෙම උණුසුම් වාතය ඉහළ නගින තරමට හීතල වෙනවා. ඒ නිසා පොළොවෙන් ඉතා වැඩි දුරක් ඉහළ නැංගා ම එහි හීතල වැඩි ය.

අහසේ පාවෙන බැලුමේ නැගලා ඉහළ ගිය කුරුමිට්ටන්ට හීතල දැනුණේ මේ හේතුව නිසයි. ඒ ගොල්ලන්ගේ නාස සහ කම්මුල් රතු වෙන තරමට හීතල වැඩි වෙලා. ඒ ගොල්ල බැලුමේ කූඩුවට පාද ගසමින් දෑත්වලින් අත්පුඩි ගැසුවේ ඇඟ රත් කර ගන්නටයි. වැඩියෙන් ම හීතල දැනුණේ කලබල පැංචාටයි. මේ ගුවන් ගමනට එයාගේ තොප්පිය ගෙනෙන්නට අමතක වුණා. එයාට හීතල තදින් ම දැනුණා. එවිට එයාගේ නහය උඩ පිනි මිදිලා එය දිගැති අයිස් කෑල්ලක් බවට පත් වුණා. එයා වෙවුලනවා. එයාගේ දත් ගැටෙනවා.

"ඔයා දත්වලින් සද්ද නොකර ඉන්න! මෙතැන බොහොම හීතලයි. ඔයා ඒ මදිවට දත් ගටනවා!" දොඩවන රාළ කීවා.

"හීතල නිසා මම වෙවුලනවා. ඉතින් මම එයාට වරදකරුවෙක් ද?" කලබල පැංචා ඇහුවා.

දොඩවන රාළ හිටි තැනින් නැගිටලා මෙහෙම කීවා.

"මගේ කන ළඟ කට-කට ගාලා දත් ගටන විට මට උහුලා ගෙන ඉන්න බැහැ! මාත් වෙවුලන්නට පටන් ගන්නවා."

එයා ගිහින් වීදුරු බටේ ළඟ වාඩි වුණා. නමුත් වීදුරු බටේගෙත් දත් ගැටෙන සද්දය ඇහුණා. දොඩවන රාළ ඔහු දෙස සැක සිතින් බැලුවා.

"ඔයාට මක් වෙලා ද? ඔයා දත් ගටා සද්ද කරන්නේ ඕනෑවට නේ ද?"

"ඕනෑවට නොවෙයි. හීතල වැඩි කමට"

දොඩවන රාළ වෙනින් තැනකට ගිහිල්ලා වාඩි වුණා. ඉතින් එයා කීප වරක් ම එහෙම වාඩි වෙමින් අනිත් අයට කරදර කළා.

හීතල නිසා ගුවනේ පා වෙන බැලුම පුරා පිනි තට්ටුවක් ඇති වෙලා. මේ පිනි තට්ටුව දිලිසෙන නිසා එය රිදී වගේ පෙනුණා. බැලුම ඇතුළෙ තියෙන වාතය හීතල වීමට පටන් ගත්තා. එවිට බැලුම සෙමින්, සෙමින් පාත් වුණා. විනාඩි කීපයක් යන විට, බැලුම වේගයෙන් පහළට වැටෙන්නට පටන් ගත්තා. ඒ වන විට වැලි මලු සියල්ල විසි කරලා තිබුණු නිසා දැන් ඉතින් පහත වැටෙන වේගය නැවැත්වීමට විදිහක් නැහැ.

"අනතුරක්, භයානක අනතුරක්!" මී පැණි චුට්ටා කෑ ගැසුවා.

"අපි විනාශ වෙනවෝ!" වැඩ බැරි දාස කෑ ගසා කියලා බංකුව යට සැඟවුණා.

"බංකුව යටින් එළියට එනවා!" දක්ස පාල කෑ ගැහුවා.

"මොකට ද?" බංකුව යට හැංගිලා ඉන්න වැඩ බැරියා අහනවා.

"දැන් අපි පැරෂුට්වලින් බිමට පනිමු."

"මට බැහැ. මට මෙතැන හොඳයි" වැඩ බැරි දාස කීවා.

දක්ස පාල වැඩ බැරි දාසගේ කරෙන් අල්ලා එයාව එළියට ඇදලා ගත්තා.

"එහෙම කිරීමට අයිතියක් නැහැ! මම ඔයාට විරුද්ධ ව පැමිණිලි කරනවා" වැඩ බැරි දාස කෑ ගැහුවා.

"කෑ ගහන්න එපා. බය වෙන්න ඕන නැහැ. මම පැරෂුට් එකෙන් පනින හැටි බලන්න. ඉන් පසු ව ඔයත් බිමට පනින්න" දක්ස පාල කීවේ සන්සුන් ලෙසින්.

වැඩ බැරි දාස තරමක් සන්සුන් වුණා. දක්ස පාල කූඩුවේ අයිනට ඇවිත් අනික් අයට කතා කළා.





"සෝයුරනි! සවන් දෙන්න. මට පසු එක්, එක්කෙනා පැරචුට් අරගෙන බිමට පනින්න! පනින්නේ නැතුව හිටියොත් බැලුමත් සමග තවත් ඉහළට ඇදිලා යාවි. සියලු දෙනා ම පැරචුට් සූදානම් කර ගන්න... පටන් ගනිමු!"

දක්ස පාල පළමුවෙන් බිමට පැන්නා. ඊළඟට පැන්නේ කඩිනම් රාළ. එවිට බලාපොරොත්තු නොවෙච්ච දෙයක් සිද්ද වුණා. ඉස්සෙල්ලා පැනලා, ඉන් පසු ව තමයි පැරචුට් කුඩය දිග හරින්නට ඕන. හැමදා ම කලබල වන කඩිනම් රාළ ඉස්සෙල්ලා පැරචුටය දිග හැරලා පසුව බිමට පැන්නා. එනිසා එයාගේ පැරචුටය කූඩුවේ කෙළවරක පැටලුනා. එයා පැරචුටය අවුල් කර ගත්තා. දැන් ඉතින් කඩිනම් රාළ හිස පහළට දමා ගෙන කකුලකින් එල්ලී ගෙන ඉන්නවා. එයා දෙපා හොළවා ඇඟ නටවන්නට පටන් ගත්තා. කොහොම කළත් එයාට ගැළවීමට ඉඩ ලැබුණේ නැහැ.

"සෝයුරනි! දැන් කඩිනම් රාළගේ පැරචුටය ලිහිලා ගියොත් එයාගේ ඔලු ගෙඩිය මහ පොළොවේ හැප්පේවි" දොස්තර පැංචා කෑ ගැසුවා.

එවිට කුරුම්ට් පැංචෝ සියලු දෙනා ම එකතු වෙලා කඩිනම් රාළගේ පැරචුට් එකත් සමග එයාව ආපහු කූඩයට ඇදලා ගත්තා.

බැලුම් බෝලය උඩ යන හැටි දැකපු වැඩ බැරි දාස කෑ ගසා මෙහෙම කීවා.

"මිතුරනි, පොඩ්ඩකට නැවතියල්ලා! දැන් ඉතින් බිමට පැනීම අවශ්‍ය නෑ. අපේ බැලුම ආයෙමත් උඩ යනවා."

"අපි ආයෙමත් ඉහළ නගින්නේ මක් නිසා ද?" එහෙම ඇහුවෙ මවිත වුණු 'අනේ-අපොයි'.

"අනේ බාං! දක්ස පාල පැනපු නිසා බැලුම සැහැල්ලු වුණා. නුඹලාට එය වත් තේරුම් ගන්නට බැහැ!"

"දක්ස පාල අප නැතුව මොනවා කරාවි ද?" පොන්චික් ප්‍රශ්න කළා.

"ඉතින් මොක ද! එයා හෙමින් සීරුවෙ ගෙදර යාවි" අනේ-අපොයි පිළිතුරු දුන්නා.



"අපි දක්ස පාල නැතුව මොනවා කරමු ද?"

"මහ ලොකු කෙරුවාවක්! දක්ස පාල නැතුව මොනවත් කරන්නට බැහැ වගේ" වැඩ බැරියා කයිවාරු ගැහුවා.

"කවුරු හරි අපට මග පෙන්වන්න ඕන!" පොන්චික් කීවා.

"ඔය ළමයි මගේ කීම අහන්න ඕන. දැන් ඉතින් මම තමයි මෙතැන ලොක්කා!" වැඩ බැරියා පැවසුවා.

"අපෝයි, හරි එක්කෙනෙක් තමයි. ඔයා වගේ මෝඩයකුට ලොක්කා විය නොහැකියි" දොඩවන පැංචා කීවා.





"ඒකත් එහෙම ද? මම මෝඩයෙක් ද? මගේ නායකත්වය ඔයා පිළිගන්නේ නැති නම්, බිමට පැනලා ඔයාගේ දක්සපාලව හොයා ගෙන එනවා," වැඩ බැරි දාස කීවේ බොහොම කේන්තියෙන්.

දොඩවන පැංචා බිම බලලා මෙසේ කීවා:

"මම දැන් එයාව හොයන්නේ කොහොම ද? අපි ඈතට පියාඹා ගිහිල්ල නෙව. අපි සියලු දෙනා එකවර ම පැනිය යුතුව තිබුණා."

"නැහැ! දැන් ම පනිනවා! පනිනවා!"

දොඩවන්නයි වැඩ බැරියයි හවස් වන තුරු ම වාද විවාද කළා. දක්ස පාල නැති නිසා මේ දෙන්නාව නැවැත්වීමට කාටවත් බැහැ. ඉර බැස යන්නත් ළං වෙලා. සුළං හැමීම වැඩි වුණා. බැලුම තවත් හීතල වෙලා පාත් වීමට පටන් ගත්තා. නමුත් දොඩවන්නාගේ සහ වැඩ බැරියාගේ වාද විවාද අවසන් වෙලා නැහැ.

"වාද කිරීම නවත්වනවා!" මී පැණියා වැඩ බැරි දාස ගෙන් ඉල්ලා හිටියා. "ඉතින් ඔයා අපේ නඩේ ලොක්කා නම්, මොනවා හරි කල්පනා කරන්න! පේනවා නේ ද අපි පහළට වැටෙමින් සිටින හැටි."

"ඉතින් මම කල්පනා කරන්නම්!" වැඩ බැරි දාස පිළිතුරු දුන්නා.

එයා බංකුවක වාඩි වෙලා නළලට ඇඟිල්ලක් තියා ගෙන කල්පනා කරන්නට පටන් ගත්තා. ඒ අතර අහසේ පාවෙන බැලුම ඉක්මනට බිමට පහත් වීමට පටන් ගත්තා.

"ඉතින් ඔයා කල්පනා කළේ මොනවා ද? අප ළඟ වැලි පුරවපු මිටි තිබුණා නම්, එක මිටියක් බිමට විසි කරන්න තිබුණා." එසේ කීවේ ඉස්කුරුප්පු බාස් උන්නැහේ.

"හරියට හරි! අපි ළඟ වැලි මිටි නැති නිසා නුඹලාගෙන් එක් කෙනෙකුව බිමට විසි කරන්නට සිද්ද වෙනවා. එයාව අපි පැරචූට් එකත් සමග විසි කරමු. එවිට අපේ බැලුම සැහැල්ලු වෙලා තවත් උඩ යාවි."

"විසි කරන්නේ කාව ද?"

"කාව ද කියලා අහන්නේ? වැඩියෙන් ම දොඩවන පැංචාව විසි කරමු"යි කියලා ටික වේලාවක් කල්පනා කළ වැඩ බැරි දාස කීවා.

"මම ඒ යෝජනාවට විරුද්ධයි." දොඩවන පැංචා පිළිතුරු දුන්නා. "වැඩියෙන් ම දොඩවන පැංචාව විසි කරන්න ඕන කියන නීතියක් නැහැ. වැඩියෙන් ම බර ඇති එක්කෙනාව විසි කරන්නට ඕන."

"මම ඒ යෝජනාවට කැමතියි" වැඩ බරි දාස එකඟ වුණා. "අපි පොන්චික්ව විසි කරලා දාමු. එයා තමයි අප අතර ඉන්න ඉතාම මහත කුරුමිටි පැංචා."



"හරියට හරි" මී පැණියා එයට අනුබල දුන්නා.

"මොන බොරු ද? වැඩියෙන් ම මහත මම ද? මී පැණියා මටත් වැඩිය ගොඩාක් මහතයි!" පොන්චික් කෑ ගහලා කීවා.

"ඔන්න එයා දිහා බලාපල්ලා!" යි මී පැණියා කීවේ පොන්චික් දෙසට ඇඟිල්ලක් දිගු කරලා හිනා වෙමින්. "බලාපල්ලා, එයාට වඩා මම මහත ද? හා-හා-හා! අපි ඉඟටිය මැනලා බලමු"

"හොඳයි, හොඳයි. අපි මැනලා බලමු!" පොන්චික් පොර කුකුළකු වගේ ඉදිරියට පැන්නා.

පොන්චික් සහ මී පැණියා වටේ අනෙක් අය රැස් වුණා. වැඩ බැරි දාස සාක්කුවෙන් ලනුවක් අරගෙන ඉස්සෙල්ලා පොන්චික්ගේ ඉඟටියත්, ඉන්පසුව මී පැණිගෙ ඉඟටියත් මැනලා බැලුවා. මී පැණිගේ ඉඟටිය පොන්චික්ගේ ඉඟටියට වඩා ගොඩක් මහතයි.

"ඒක හරි නැහැ! පොන්චික් හුස්ම පිට කරලා බඩ හීන් කර ගත්තා. මම බඩ මහත් කර ගත්තා. මම එය හොඳට දැක්කා!" යැයි මී පැණි කෑ ගහලා කීවා.

"මම එහෙම කළේ නැහැ!" පොන්චික් ඒ කතාවට විරුද්ධ වුණා.

"නැහැ, ඔයා හුස්ම පිට කරලා, බඩ හකුළුවා ගෙන හිටියා. ආයෙමත් මැනලා බලමු!" එහෙම යෝජනා කළේ මී පැණි.

තවත් වරක් වැඩ බැරි දාස පොන්චික්ගේ ඉඟටිය මනින්නට පටන් ගත්තා. මී පැණි පොන්චික් වටේ යමින් කෑ ගහන්නට වුණා.

"ආන්න! ඔයා හුස්ම පිට කරනවා නේ ද? බඩ පුම්බා ගන්නවා!"

"බඩ පුම්බා ගන්නේ මොකට ද? මම බඩ පුම්බා ගත්තොත් ඔයාට වැඩිය මහත් වෙන්නට පුළුවනි."

"බඩ පුම්බන්නට ඕන නැහැ. නමුත් හුස්ම පිට කරලා බඩ හීන් කරගන්නට එපා. සෝයුරනි, බලාපල්ලා එයා මොනව ද කරන්නේ ! මෙතැන සාධාරණයක් තියෙනවා ද? මෙතැන සාධාරණයක් නැහැ! මෙයා අපිව රවට්ටනවා"

වැඩ බැරි දාස පොන්චික්ගේ ඉගටිය මැනලා ඒ වගේ ම සැලකිල්ලෙන් මී පැණිගේ ඉගටිය මැන්නා. දෙදෙනා ම එක හා සමාන ලෙස මහත බව එවර පෙනී ගියා.

"ඔය ගොල්ලන් දෙදෙනාව ම වීසි කරන්නට සිද්ද වෙනවා" අත් දෙක විහිදා ගෙන වැඩ බැරි දාස කීවා.

"දෙදෙනෙකුව වීසි කරන්නේ මොකට ද? එක්කෙනෙකුව වීසි කළා ම හොඳට ම ඇති!" එහෙම කිව්වෙ මී පැණි.

දඩයම්කාර පැංචා කූඩුවේ සිට බලන විට එයාට පෙනුණේ බැලූම බොහොම වේගයෙන් පාත් වෙන සැටි ය.

"පැරචුටයෙන් බිමට පැන්න යුත්තේ කවුදැ යි කියලා ගණන් කරන්නට ඕන!" එලෙස පැවසුවේ 'අනේ-අපොයි' ය.

"ඒ කතාව හරි! ඔක්කෝමල්ලාව ගණන් කරන්නට ඕන. කෙට්ටු ද මහත ද කියන එක ගණන් ගැනීම තහනම්. එවිට කිසිවෙක් අමනාප වෙන්නේ නැහැ." මී පැණි එයාගේ අදහස ඉදිරිපත් කළා.



"හොඳයි. අපි ගණන් කරමු"යි වැඩ බැරි දාස එකඟ වුණා.

කුරුමිට්ටි පැංචෝ වටේට හිට ගත්තා. එක් එක් පැංචා දෙස ඇඟිල්ල දිගු කරලා වැඩ බැරි දාස ගණන් කරන්නට පටන් ගත්තා.

**ටිකිරි මිකිරි චටස් පටස්!**
**කැකිරි ළපටි හුටස් පුටස්!**
**සුකිරි මිහිරි දඩස් බඩස්...**

පසුව ඔහු ටික වේලාවක් කල්පනා කරලා මෙසේ ද කීවා.


"අපොයි, මම ඒ කවියට කැමති නැහැ. වෙනින් කවියක් මම දන්නවා. අපි එය අනුව ගණන් කරමු."

**අයියයි, මල්ලියි කඩේ ගියා**
**අක්කයි, නංගියි ගෙදර හිටියා**
**හිවලා ඇවිත් වැටෙන් පැනලා**
**රතු කුකුළව අරන් ගියා...**

මෙසේ ගණන් කරන විට බිමට බැහැපු බැලුම සහිත කූඩුව දඩාස් ගාලා බිමට හැප්පුණා. 'අනේ-අපොයි' පැංචා බය නැත්තාගේ අතින් අල්ලා ගත්තා. ඒ දෙදෙනා ම කූඩුවෙන් පිටතට පැන ගත්තා. මේ දෙදෙනාට පසුව අනික් කුරුමිට්ටි පැංචෝ එළියට පැන ගත්තා. බැලුමේ ඉතුරු වුණේ වැඩ බැරි දාස සහ දඩයම් බල්ලා විතරයි. වැඩ බැරි දාස ගේ කලිසමේ කටින් එල්ලීගෙන දඩයම් බල්ලා හිටියා. බිමට හැප්පිලා බැලුම, පන්දුවක් වගේ උඩට විසි වෙලා වටයක් පියාඹලා ආයෙමත් බිම වැටුණා.







බැලුමේ කූඩුව පොළොවට හැප්පෙන විට, බැලුම ගහක අත්තට සීරිලා මහ විශාල හඬක් ඇති කරලා පිපිරුණා. දඩයම් බල්ලා උඩට වීසි වෙලා බිම වැටුණා. ඌ කෙඳිරි ගාලා පැනලා දිව්වා. කූඩුවෙන් එළියට වීසි වෙලා ගිය වැඩ බැරි දාස බිම වැටිලා හෙළවෙන්නේ නැතිව බිම වැතිර හිටියා.

ගුවන් ගමන එතැනින් අවසන් විය.







වැඩ බැරි දාසගේ හපන්කම් ගැන ඔබ වැඩි දුරටත් සැලකිලි දක්වයි නම්, කුසුම් පුරයේ වැසියන් ගැන දැන ගැනීමට ඔබ ආශා කරයි නම් මේ පොත් පෙළට අයත් අනික් පොත් කියවන්නः

මී පැණි පැලැස්තරය

අලුත් යාළුවෝ

ISBN 978-955-1319-74-8

සී/ස ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්) සමාගම

91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

LKR 200/-

Kanol